# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1904/57 - 2015 මාර්තු මස 06 වැනි සිකුරාදා - 2015.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : සීඑස්ඒ/7/සීඕඅයි/එම්එස්/01

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

1. ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසාද් ජෙරාඩ් ඩෙප් මැතිතුමා<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු අනිල් ගුණරත්න මැතිතුමා<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා<br>මහාධිකරණ විනිශ්චයකාර
4. සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ මැතිතුමා<br>විශ්‍රාමික විගණකාධිපති
5. ජනාධිපති නීතිඥ අයියතුරෙයි ඥානදාසන් මැතිතුමා<br>විශ්‍රාමික අතිරේක සොලිසිටර් ජනරාල්

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

2010 ජනවාරි මස 10 වැනි දින සිට 2015 ජනවාරි මස 10 වැනි දින දක්වා කාල සීමාව තුළ සිදුවූ දූෂණ ක්‍රියා, වංචා, සාපරාධී ලෙස විශ්වාසය කඩ කිරීම, දේපළ සාපරාධී ව්‍යපහරණය, රැවටීම සහ බලය හෝ අධිකාරය, රාජ්‍ය සම්පත් හා වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය සහ එකී වරදවල් හා වැරදි ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය වත්කම් සහ ආදායමට බරපතළ අලාභ හෝ හානි සිදුවීම සම්බන්ධයෙන් දේශපාලන පදවි දැරූ හෝ තවදුරටත් දරමින් සිටින පුද්ගලයින්ට සහ රජයේ සේවකයින් වශයෙන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් වශයෙන් සේවයෙහි නිරතව සිටි හෝ තවදුරටත් සේවයෙහි නිරතව සිටින පුද්ගලයින්ට එරෙහිව බරපතළ පැමිණිලි සහ චෝදනා විශාල ගණනක් ඉදිරිපත් කරනු ලැබ හා ඉදිරිපත් කෙරෙමින් පවතින සහ තොරතුරු ලැබෙමින් ඇති හෙයින්ද,

1A - G 21159 — 360 (2015/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, එම පැමිණිලි, චෝදනා හා තොරතුරුවල සත්‍යතාව නිශ්චය වශයෙන් සොයා දැනගැනීමේ අරමුණෙන් එකී පැමිණිලි, චෝදනා හා තොරතුරු සම්බන්ධයෙන් ස්වාධීන, අපක්ෂපාතී හා පුළුල් අපරාධ සහ සෙසු විමර්ශන හා පරීක්ෂණ කිසිවක් පවත්වනු ලැබ නොමැති හෙයින්ද,

තවද, නීතිය නිසියාකාරයෙන් බලාත්මක කරලීම සහ වරදකරුවන්ට නීති ප්‍රකාරව කටයුතු කිරීම සහ වරදවල් හා බලය හෝ අධිකාරය අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය ආදී සිදුවී යැයි කියනු ලබන ක්‍රියාවන් යළි සිදුනොවීම සහතික කරලීම සඳහා ගතයුතු පියවර නිශ්චය කරගනුවස් විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම මහජන ආරක්ෂාව හා සුබසිද්ධිය පිණිස හේතුවන බැව් මා අදහස් කරන හෙයින්ද,

මෙහි මින්මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර, පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කළ යුතු යැයි මා අදහස් කරන හෙයින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය, ස්වාධීනතාව සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී,

1. ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසාද් ජෙරාඩ් ඩෙප් මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු අනිල් ගුණරත්න මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර
4. සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ මැතිතුමා
   විශ්‍රාමික විගණකාධිපති
5. ජනාධිපති නීතිඥ අයියතුරෙයි ඥානදාසන් මැතිතුමා
   විශ්‍රාමික අතිරේක සොලිසිටර් ජනරාල්

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර, පරීක්ෂාකොට වාර්තා කරනු පිණිස මගේ කොමසාරිස්වරුන් ලෙසින් මෙයින් පත්කරමි.

1. 2010 ජනවාරි මස 10 වැනි දින සිට 2015 ජනවාරි මස 10 වැනි දින දක්වා කාල සීමාව තුළ දූෂණ ක්‍රියා, වංචා, සාපරාධී ලෙස විශ්වාසය කඩකිරීම, දේපළ සාපරාධී ව්‍යාපහරණය, රැවැටීම සහ බලය හෝ අධිකාරය, රාජ්‍ය සම්පත් හා වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය සහ එකී වරදවල් සහ වැරදි ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය වත්කම් වලට, රාජ්‍ය ආදායමට බරපතළ අලාභ හෝ හානි සිදුවී තිබීම සම්බන්ධයෙන් දේශපාලන පදවි දැරූ හෝ තවදුරටත් දරමින් සිටින පුද්ගලයින්ට සහ රජයේ සේවකයින් සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් වශයෙන් සේවයේ නිරතව සිටි සහ තවදුරටත් සේවයේ නිරතව සිටින පුද්ගලයින්ට එරෙහි බරපතළ චෝදනා පිළිබඳව මහජන පැමිණිලි, තොරතුරු සහ සෙසු කරුණු කැඳවීම සහ ලබා ගැනීම ;

2. ඉහත කී 1 වෙනි ඡේදයේ සඳහන් පැමිණිලි, තොරතුරු සහ චෝදනා පිළිබඳව කඩිනම්, අපක්ෂපාතී, පුළුල් විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම ;

3. එබඳු වරදවල්, වැරදි ක්‍රියාවන් සහ බලය හෝ අධිකාරිය, රාජ්‍ය සම්පත් සහ වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය සිදුකිරීම සම්බන්ධයෙන් නීති ප්‍රකාරව වගකිව යුතුව සිටි හෝ වගකිව යුතු වන පුද්ගලයින් හඳුනා ගැනීම ;

4. පූර්වෝක්ත 1 වන ඡේදයේ සඳහන් එබඳු වරදවල් හා වැරදි ක්‍රියාවන් පිළිබඳව සහ එබඳු සිද්ධීන්ට සහ වැරදි ක්‍රියාවන්ට අදාළ වූ වරදවල් සිදුකර තිබීම පිළිබඳව වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව ලබා ගත හැකි සාක්ෂි හඳුනා ගැනීම හා එක්රැස් කිරීම ;

5. ඉහත කී වරදවල් සිදුකරන ලදැයි කියනු ලබන පුද්ගලයින්ට එරෙහිව සාපරාධී නීති කෘත්‍ය ඇරඹීමේ අරමුණින් අවශ්‍ය විමර්ශන හා පරීක්ෂණ කටයුතු පැවැත්වීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලීසියට හෝ වෙනත් නීති බලාත්මක කිරීමේ අධිකාරියකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ඉදිරිපත් කළ යුත්තේ ඉහත 1 වන ඡේදයේ සඳහන් කරුණු ගණයට ඇතුළත් ක්‍රියාවලින් කවර ඒවාදැයි හඳුනා ගැනීම ;

6. ඉහත කී වරදවල් සිදුකර ඇතැයි කියනු ලබන පුද්ගලයින්ට එරෙහිව සාපරාධී නීති කෘත්‍ය ඇරඹීම පිළිබඳව සලකා බැලීම සහ වූදිතයන්ට නඩු පැවරීමට නීතිපතිවරයාට අවකාශ සලසනු පිණිස විමර්ශන සහ පරීක්ෂණ පාදක කරුණු නීතිපතිවරයාට ඉදිරිපත් කිරීම ;

7. වරදවල් සහ වැරදි ක්‍රියාවන් සිදුකර තිබීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තන්ට එරෙහිව ගත යුතු යම් ක්‍රියාමාර්ග වෙතොත් ඒ පිළිබඳව කොමිසමේ නිර්දේශ සහ එබඳු වරදවල් හා වැරදි ක්‍රියාවන් ඉදිරියේ දී සිදුවීම වළක්වාලීමේ අරමුණින් කරනු ලබන නිර්දේශ මවෙත ඉදිරිපත් කිරීම ;

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ **සභාපතිවරයා** වශයෙන් ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු **ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසාද් ජෙරාඩ් ඩෙප් මැතිතුමා** වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, පෙර කී කරුණු සම්බන්ධයෙන් අවශ්‍යයැයි ඔබට පෙනීයාහැකි සාපරාධී හා ව්‍යවහාරික විමර්ශන පැවැත්වීමට හෝ පැවැත්වීමට සලස්වාලීම සහ සියලුම ප්‍රසිද්ධ සහ / හෝ රහස්‍ය හෝ විමර්ශන හෝ පරීක්ෂණ කිරීමට ද ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මා මෙයින් බලය හා අධිකාරිය පවරන අතර, මේ අධිකාරි පත්‍රයෙහි දින සිට දෙමසක් ඇතුළත පළමුවැනි අතුරු වාර්තාව ද, ඊට අනතුරුව දෙමසකට වරක් අතුරු වාර්තා ද මෙහි සඳහන් දින සිට **එක් වසරක්** ඇතුළත ඔබේ විමර්ශනයන්හි සහ පරීක්ෂණයන්හි නිගමනයන් හා ඒවාට අදාළ ඔබේ නිර්දේශයන් ඇතුළත් අවසන් වාර්තාව ද ඔබේ අත්සනින් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, මෙම කොමිෂන් සභාවේ රැස්වීම්වල ගණපූරණය සඳහා ඔබ අතුරින් ඕනෑම කොමසාරිස්වරුන් තිදෙනෙකු සහභාගි විය යුතුයැයි මම ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණා වලට අදාළ වන කිසියම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතුයැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන්, ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතුයැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතුයැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, ඉහතකී පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි විධිවිධාන මෙම කොමිෂන් සභාවට අදාළ වියයුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් පහළොවක් වූ මාර්තු මස 03 වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්
ජනාධිපති ලේකම්

03 - 625

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.